මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.07.28

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 05/2022 (ii)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්

<u>ජ්‍යෙෂ්ඨත්වයට හානියක් නොවන පරිදි රාජ්‍ය ව්‍යවසායන්හි නිලධාරීන්ට විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2023.07.13 දින නිකුත් කරන ලද අංක 14/2022(III) දරන චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට සමගාමීව, රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින් සඳහා විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට අදාළව නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 05/2022 හා PED 05/2022(i) ඡේද අංක 2 හි විධිවිධානද පහත දැක්වෙන පරිදි සංශෝධනය වේ.

2. ඒ අනුව, 2023.07.11 දින සිට වැටුප් රහිත විදේශීය නිවාඩු අනුමත කරනු ලබන නිලධරයන්ගේ වැටුප් රහිත නිවාඩු කාල සීමාව, එකී නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨත්වය ගණනය කිරීම සඳහා අදාළ කර නොගත යුතුය.

3. එම නිසා, 2022.08.22 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 05/2022 හි 3 ඡේදයේ 3.5, 3.6 හා 3.11 යන වගන්ති 2023.07.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරනු ලබන අතර, 3.14 වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

"ඉහත 3.9 යටතේ දක්වා ඇති පරිදි විධිමත්ව මෙරටට මුදල් ප්‍රේෂණය නොකරන හෝ ගිවිසුමේ කොන්දේසි එකක් හෝ කිහිපයක් කඩ කරන නිලධාරීන් මෙම චක්‍රලේඛය මගින් සලසා ඇති කිසිදු සහනයක් සඳහා හිමිකම් නොලබයි."

4. උක්ත චක්‍රලේඛ විධිවිධාන අනුව 2023.07.11 දින සිට විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගත් නිලධරයෙකු එම නිවාඩු කාලය අවසන්ව නැවත සේවයට වාර්තා කළ පසු නිලධරයාගේ ජ්‍යෙෂ්ඨතාවය එකී වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට පෙර දින පැවති ජ්‍යෙෂ්ඨතාවය වේ.

5. මෙම විධිවිධාන යටතේ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා නිලධරයන් (PED 05/2022 හි වගන්ති අංක 3.10 හි සඳහන් ගිවිසුම වෙනුවට) මේ සමඟ ඇමුණුම 01 ලෙස දක්වා ඇති ගිවිසුමට එළඹිය යුතුය.

6. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් දුරකථන අංක 011-2484627 මගින් රාජ්‍ය ව්‍යාපාර අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසිය යුතුය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන

භාණ්ඩාගාර ලේකම්

ඇමුණුම 01

# ගිවිසුම් පත්‍රය

## රජය සතු ව්‍යවසායන්හි නිලධරයන්ට විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම

මෙහි පහත ඇතැම් තැනෙක " පළමු පාර්ශ්වය" ලෙස හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ...............................................(රාජ්‍ය ව්‍යාපාරයේ නම) ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ ජනරාල්* ...........................................................................(නම) සහ මතුවට ...................................... (රාජ්‍ය ව්‍යාපාරයේ නම) ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ ජනරාල්* වශයෙන් හඳුන්වනු ලබන යම් තැනැත්තෙකු එක් පාර්ශ්වයකටද,

මෙහි "දෙවන පාර්ශ්වය" ලෙස හඳුන්වනු ලබන පහත නම් සඳහන් අය/නිලධරයා අනෙක් පාර්ශ්වයට ද බැඳි එකී දෙපාර්ශවය අතර වර්ෂ ..................ක් වූ ..............මස.............දින .............................දී ඇතිකරගත් ගිවිසුම් පත්‍රයයි.

ඉහත කී පළමු පාර්ශ්වය විසින්, ඉහත කී දෙවන පාර්ශ්වය වන ...............................................(නිලධරයාගේ ස්ථිර ලිපිනය) හි පදිංචි................................................................................................ (රාජ්‍ය ව්‍යාපාරයේ නම) හි ..........................................තනතුර දරන ............................. (නිලධරයාගේ සම්පූර්ණ නම) යන අයට පහත සඳහන් කොන්දේසි සහ බැඳීම් වලට යටත්ව රජය සතු ව්‍යවසායයන්හි නිලධරයන් සම්බන්ධයෙන් වන විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම අනුමත කරනු ලැබේ.

එකී කොන්දේසි සහ බැඳීම් කවරේද යත්,

01. නිලධරයා විසින් වැටුප් රහිත විදේශීය නිවාඩු අනුමත කර ගැනීමේදී නිසි ක්‍රමවේදය අනුගමනය කිරීමට වගබලා ගත යුතුය.
02. නිලධරයා විසින් ලබා ගන්නා ඉහත කී විදේශීය නිවාඩු කාලය (.................) දින සිට (................) දක්වා වන අතර, එකී නිවාඩු කාලය උපරිම වසර 5 කට සීමා විය යුතුය.
03. නිලධරයා වැටුප් රහිත විදේශීය නිවාඩු අනුමත කර ගැනීමේදී ඉහත කී විධිවිධාන ඇතුලත් PED 05/2022, PED 05/2022(i) හා PED 05/2022(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධාන එපරිදි ම අදාළ වන පරිදි අනුගමනය කිරීමට වග බලාගත යුතුය.

ඉහත කී කොන්දේසි සහ බැඳීම් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එබදු අවස්ථාවක දී අදාල බලධරයින් විසින් ගනු ලබන ඕනෑම විනය හා නෛතික ක්‍රියාමාර්ගයකට නිලධරයා යටත් වනු ඇත.

ඊට සාක්ෂි පිණිස ඉහත කී පළමු පාර්ශ්වකාර ............................................ රාජ්‍ය ව්‍යාපාරයේ ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ ජනරාල්*..............................................................................(නම) හා දෙවන පාර්ශ්වකාර...........................................................................(නිලධරයාගේ සම්පූර්ණ නම) යන දෙපාර්ශ්වය විසින් වර්ෂ ................ක් වූ ................ මස .............දින අත්සන් තබන ලදී.

01 පළමු පාර්ශ්වය .........................(අත්සන)
..........................(ජා.හැ.අංකය)
.........................(නිල මුද්‍රාව)

02 දෙවන පාර්ශ්වය ........................(අත්සන)
........................(ජා.හැ.අංකය)

**සාක්ෂි**

01 ........................(අත්සන)
........................(නම)............................(ජා.හැ.අංකය)
........................(ලිපිනය)

02 ........................(අත්සන)
........................(නම)............................(ජා.හැ.අංකය)
........................(ලිපිනය)

*ආයතන ප්‍රධානියාගේ තනතුර අවශ්‍ය පරිදි වෙනස් කළ යුතුය.